# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 5 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2001 අප්‍රේල් මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 5.75 යි.** තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

## 2001 අංක 5 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 20/2001.

**1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2001 අංක 5 දරන භාණ්ඩ හා සේවා බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 26 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 1996 අංක 34 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "ශුන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය." යන වචන වෙනුවට "ශුන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය ;"; සහ

(2) ඒ උපවගන්තියේ අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(ඈ) පහත දැක්වෙන සේවාවලින් කිසිවක් ශුන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය :–

(i) මුළුමණින් ම ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම සඳහා පරිගණක මෘදුකාංග නිර්මාණකරුවකු තමා විසින් නිර්මාණය කරනු ලබන මෘදුකාංග සම්බන්ධයෙන් සහ බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්යය සඳහා ගෙවීම් ලැබෙන සහ සේවා සැපයීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිද්දෙන් ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක පමණක් ඒ මෘදුකාංග නිර්මාණකරුවකුගේ සේවය ;

2—H 011619— 4,400(2001/04)

(ii) බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන ශ්‍රී ලංකාවෙන් පිටත හඳුනාගත් එක් සේවාපේක්ෂකයකුට හෝ සේවාපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවකට අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ අනන්‍යව සේවාපේක්ෂක ආධාරක සේවා සැපයීම පිණිස 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසුව පිහිටුවන ලද ව්‍යවසායක් විසින් අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ සපයන සේවාපේක්ෂක ආධාරක සේවා, ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 2000 අංක 26 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියෙහි "ඒ මුදල මත ඒ ආපසු ගෙවීම ඇති වූ බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ" යන වචන වෙනුවට "ඒ මුදල මත ඒ ආපසු ගෙවීම සඳහා ඉල්ලීම කළ බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයේ (ඇ) ඡේදයේ "කාලසීමාව ඉහතින් ම වූ" යන වචන වෙනුවට "කාලසීමාවට පෙරාතුව වූ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1998 අංක 11 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"එසේ වුවද තවදුරටත් 22 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයේ සඳහන් වන ලියාපදිංචි තැනැත්තකු විසින් වැඩිපුර ගෙවා ඇති එවැනි යම් මුදලක් බදු අයකළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසු හෝ ඒ වැඩිපුර ගෙවීම උද්ගත වූ බදු ගෙවිය යුතු කාලසීමාව සඳහා වාර්තාව ලැබුණු දිනය යන දෙකින් පසුව එළඹෙන දිනයේ සිට එක් මාසයක් ඇතුළත ඒ තැනැත්තාට ආපසු ගෙවිය යුතු ය".

5. 2000 අංක 26 දරන පනතින් අවසන්වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ "බදු අය කළ හැකි කාලසීමාව" යන යෙදුමෙහි අර්ථකථනයේ (අ) ඡේදය මෙයින් පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "උපලේඛනයෙහි" යන වචනය ඉවත් කොට ඒ වෙනුවට "2001 අප්‍රේල් මස 01 වන දිනට පෙරාතුව, උපලේඛනයෙහි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ඡේදය අවසානයෙහි පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(vii) උපලේඛනයේ (xxviii) වන විෂයයේ සඳහන් වන පරිදි යම් තැනැත්තකු විසින් ආයෝජන මණ්ඩලය සමග එවැනි යම් ගිවිසුමකට ඇතුළත් වී ඇති සහ ගිවිසුම අදාළවන ව්‍යාපෘතිය යටතේ බදු අය කළ හැකි සැපයුම් කිරීම 2001 මාර්තු 31 වන දිනට ආරම්භ කිරීමට ඒ තැනැත්තාට නොහැකි වන අවස්ථාවක දී ".

6. 2000 අංක 26 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ (xxiii) වන විෂයයෙහි "මගී ආසන තිහකට නොඅඩු" යන වචන ඉවත්කොට ඒ වෙනුවට "මගී ආසන විසිඅටකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ (xxviii) වන විෂයයෙහි "නියම කර ඇති යම් භාණ්ඩයක්," යන වචනවල සිට එහි අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"නියම කර ඇති යම් භාණ්ඩයක්,

(අ) (i) ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු, බද්දට යටත් සැපයුම් සිදුකරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට නියමිත දිනයේ සිට අවුරුදු තුනක කාලයක් තුළ ; හෝ

(ii) ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු බද්දෙන් නිදහස් සැපයුම් පමණක් සිදුකරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, නියමිත දිනයේ සිට අවුරුදු හතරක කාලයක් තුළ ; හෝ

(ආ) ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තෙක්,

යන කාලසීමාව අවසන් වන දින යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක්, ආනයනය කිරීම ;

(3) ඒ උපලේඛනයේ (xxxii) වන විෂයය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

"(xxxii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති ව්‍යවසායයක් විසින් මුළු පිරිවැය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන හා තනිකරම නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම සහ කුලියට දීම සඳහා වන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම හෝ කුලියට දීම හැර, පදිංචිය සඳහා නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම හෝ කුලියට දීම ;"

(4) ඒ උපලේඛනයේ (xxxiv) වන විෂයය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

"(xxxiv) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති වෛද්‍ය ආයතනයක් විසින්, මුළු පිරිවැය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන

දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් සෞඛ්‍ය ආරක්ෂක සේවා සැපයීම හැර, සෞඛ්‍ය ආරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් හෝ සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම.".

අතීතයට බලපෑම.

**7.** (1) මේ පනතේ 2(2) වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට කරන ලද සංශෝධනය, ඒ සංශෝධනය පරිගණක මෘදුකාංග නිර්මාණකරුවන් සම්බන්ධව අදාළවන තාක් දුරට, 1998 අප්‍රේල් මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 6 (1) වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයට කරන ලද සංශෝධනය 2000 ජූලි මස 13 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.